# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1995/39 - 2016 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2016.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ ලියාපදිංචි අංක පී වී 101137 දරන සමාගමක් වන එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසියට යටත්ව, එහි උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා මෙම නියමය මගින්, මෙහි II උපලේඛනයේ II වන තීරයේ වූ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුම් සහිතව එකී II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස එකී එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගෙන සිටිමි.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් පහත සඳහන් උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්ණායක ප්‍රකාර ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම වන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා අංශයෙන් එක්වර සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා සිටීම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධි* | *II වැනි තීරය*<br>*උපාධි සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| විද්‍යුත් සහ බල පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බී එස්සී (ගෞරව) (විද්‍යුත් සහ බල පද්ධති) ඉංජිනේරු |
| විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බී එස්සී (ගෞරව) (විද්‍යුත් සහ විදුලි සංදේශ) ඉංජිනේරු |
| විද්‍යුත් සහ ඉංජිනේරු කළමනාකරණ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බී එස්සී (ගෞරව) (විද්‍යුත් සහ ඉංජිනේරු කළමනාකරණ) ඉංජිනේරු |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 නොවැම්බර් මස 28 වැනි දින.
කොළඹ දී ය.

12 - 726


1A - PG 3264 — 507 (2016/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*